දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 32/2012

බ/12/02/අයවැය/2012
මූල්‍ය ශාඛාව,
බන්ධනාගාර මූලස්ථානය.
2012.11.29

සියළුම කොමසාරිස්වරුන්,
සියළුම මාණ්ඩලික නිලධාරීන්,
සියළුම බන්ධනාගාර අධිකාරීවරුන්, සහකාර බන්ධනාගාර අධිකාරීවරුන්,

## 2012 වර්ෂය සඳහා ගිණුම් පියවීම.

2012 වර්ෂය සඳහා ගිණුම් පියවීම සම්බන්ධව රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් ගේ අංක 2012.10.31 දිනැති 226/2012 චක්‍රලේඛය හා භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් ගේ 2012.11.20 දිනැති භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 05/2012 සම්බන්ධවයි. අදාල චක්‍රලේඛ www.treasury.gov.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට ලබා ගත හැක. එම චක්‍රලේඛ අනුව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ගිණුම් පියවීමේ කටයුතු පහත උපදෙස් පරිදි සිදු විය යුතු බව අවධාරණය කරනු ලැබේ.

01. 2012 දෙසැම්බර් මාසය සඳහා ප්‍රතිපාදන හා අක්මුදල් ලබා ගැනීම.

i. බන්ධනාගාර දෙපාර්තමේන්තුව සඳහා 2012 වර්ෂය වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන වැය විෂයන් කිහිපයකම මේ වන විට අවසන්ව ඇති බැවින්, ලබා ගත් අත්තිකාරම් නිරවුල් කිරීමට ප්‍රමුඛතාවය ලබා දෙමින් අවශ්‍ය ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමට සියලුම බන්ධනාගාර ආයතන ප්‍රධානීන් වග බලා ගත යුතුය.

ii. ඔබ ආයතනයට දැනට ලබා දී ඇති සියළුම පුනරාවර්ථන ප්‍රතිපාදන 2012.11.30 දිනට ශූණ්‍ය කිරීමට කටයුතු කරනු ඇත. හිඟ බිල්පත් ගෙවීම සඳහා ප්‍රතිපාදන හා අක්මුදල් ලබා දී ඇති සියළුම ගෙවීම් අනිවාර්යෙන් ඊට පෙර නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. 2012 දෙසැම්බර් මාසය සඳහා ඔබ ආයතනයට ලබා දෙන ප්‍රතිපාදන සීමාව ඉක්මවා (ඒ ඒ වැය විෂයන්වලට අදාලව) කිසිදු ගෙවීමක් නොකිරීමට ආයතන ප්‍රධානීන් වග බලා ගත යුතුය. යම් හෙයකින් දෙසැම්බර් මාසය සඳහා ලබා දෙන ප්‍රතිපාදන ඉතිරි වන්නේ නම් ඒ බව කඩිනමින් බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙත විද්‍යුත් තැපැල (commfinace@prisons.gov.lk) මඟින් හෝ ෆැක්ස් මඟින් දැනුම් දීමට කටයුතු කල යුතුය.

iii. දෙපාර්තමේන්තුව සතු ප්‍රතිපාදන හා අක්මුදල් ප්‍රමාණය සැලකිල්ලට ගෙන නිරවුල් කල හැකි සියළුම බිල්පත් ගෙවීමට දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන් වග බලා ගත යුතු අතර, ලබා දී ඇති සියලුම අත්තිකාරම් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කල යුතුය. වෙන් කරන ලද ප්‍රතිපාදන ඉක්මවා වියදම් නොදැරීමටත් වෙන් කරන ලද ප්‍රතිපාදන ඉතිරි නොවන ලෙස වියදම් කිරීමටත් කටයුතු කල යුතුය.

iv. වර්ෂය අවසන් වීමට පෙර ගෙවීම් කිරීමට හැකිවන පරිදි 2012.12.10 දිනට පෙර නිසි පරිදි සකස් කල සියළුම ගෙවීම් වවුචර ඒ ඒ ආයතනවල ගිණුම් අංශය වෙත ලබා දීමට සියළුම අංශ හා

ශාඛා ප්‍රධානීන් වග බලා ගත යුතුය. එදිනට ඉදිරිපත් කළ නොහැකි අත්‍යාවශ්‍ය හා විශේෂ හේතු ඉදිරිපත් කළ හැකි වවුචර පමණක් පසුව භාර ගැනීමට කටයුතු කළ යුතුය.

02. <u>2012 දෙසැම්බර් 31 දිනට මුදල් පොත පියවීම.</u>

i. සියළුම බන්ධනාගාර ආයතනවල 2012 දෙසැම්බර් 28 සිකුරාදා දිනට පෙර ගමන් වියදම්, ඉන්ධන අත්තිකාරම්, සුළු අක්මුදල් ඇතුළු සියළුම අත්තිකාරම් සම්පූර්ණයෙන් පියවා ගැනීමට කටයුතු කල යුතුය. දෙසැම්බර් මස අවසන් සති දෙක තුල අත්‍යාවශ්‍ය කරුණකට හැර අග්‍රිම අත්තිකාරම් ලබා නොදිය යුතුය.

ii. <u>2012.12.28 දිනට මුදල් පොතේ (මූලධන හා පුනරාවර්තන) ඉතිරි ශේෂයේ වටිනාකම බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ බොරැල්ල ලංකා බැංකු ශාඛාවේ ගිණුම් අංක 7041491 ට චෙක්පතක් ලියා මුදල් පොත ශූන්‍ය කළ යුතුය. එම චෙක්පතේ ජායා පිටපතක් විද්‍යුත් තැපැල (commfinace@prisons.gov.lk) හෝ ෆැක්ස් මඟින් බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙත එදිනම එවීමට කටයුතු කල යුතුය. මුදල් පොතේ ශේෂයක් නොමැති නම් ඒ පිළිබඳව ලිඛිතව දැනුම් දීමට ඉහත පරිදි කටයුතු කල යුතුය.</u>

iii. බන්ධනාගාර ආයතනවල ගිණුම් පියවීමේ කටයුතු සම්බන්ධව බලය පැවරූ නිලධාරීන්ගේ නාම ලේඛණය ඇමුණුම 01 හි දක්වා ඇත. අදාල නිලධාරීන් ඒ ඒ ආයතනවල මුදල් පොත වැසීමේ වගකීම දැරිය යුතුය. 2012.12.31 දිනෙන් පසුව කිසිදු ගෙවීමක් මුදල් පොතේ සටහන් කල නොහැකිවන පරිදි එක් එක් මුදල් පොත්වල එදිනට සටහන් කෙරෙන අවසාන සටහනට යටින් රතු තීන්තෙන් ඉරක් ඇඳ තම නම, තනතුර, අත්සන, දිනය හා වේලාව සටහන් කර 2012 වර්ෂයේ මුදල් පොත නියමිත පරිදි වැසූ බවට සටහන් තැබිය යුතුය.

iv. <u>2012.12.28 දිනට මුදල් පොත ශූන්‍ය කිරීමෙන් පසු 2012.12.31 දිනට නියමිත පරිදි මුදල් පොත වැසීමේදී යම් ශේෂයක් වේනොත් ඉහත ii කරුණ යටතේ ලබා දුන් උපදෙස් අනුව කටයුතු කර එදිනම (2012.12.31) චෙක්පතක් මඟින් බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙත එවිය යුතුය.</u>

v. 2013 වර්ෂය සඳහා අවශ්‍ය අක් මුදල් බන්ධනාගාර මූලස්ථානය මඟින් ලබා දෙන බැවින් කිසිදු අග්‍රිම ශේෂයක් බන්ධනාගාර ආයතන විසින් රඳවා තබා ගැනීමට කටයුතු නොකල යුතුය.

03. <u>මාසික ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

i. 2012 දෙසැම්බර් මස මාසික ගිණුම් සාරාංශය 2013.01.05 වන දිනට පෙර ලබා දිය යුතුය. පලමුවන ගිණුම් සාරාංශයේ යම් කිසි ගිණුම්කරණ දෝෂයක් නිවරදි කිරීම හෝ හරස් සටහන් මඟින් කරනු ලබන ගෙවීමක් ගිණුම්ගත කිරීමට ඇත්නම් ඒ සඳහා පරිපූරක ගිණුම් සාරාංශයක් ඉදිරිපත් කල හැක. පරිපූරක ගිණුම් සාරාංශය 2013.01.11 වන දිනට පෙර ලබා දිය යුතුය.

ii. බැංකු සැසඳුම් ප්‍රකාශය හා අක්මුදල් සැසඳුම් ප්‍රකාශය 2013.01.11 වන දිනට පෙර ලබා දීමට කටයුතු කල යුතුය.

iii. පොදු තැන්පත් ගිණුමේ සෝටල ශේෂ උපුටා ගැනීම පොත් පියවූ වහාම සිදු කර, බන්ධනාගාර මූලස්ථානය වෙත සෝටල ශේෂ වාර්තා ඉදිරිපත් කල යුතුය.

iv. 2012 වර්ෂය අවසානයේදී පියවීමට ඇති බැරකම් හා බැදීම් පිළිබඳ (ගිහ බිල්පත්) විස්තර ඇමුණුම 02 අනුව සකස් කර 2013.01.31 වන දිනට පෙර ලබා දිය යුතුය. මහා භාණ්ඩාගාරය වෙත මෙම තොරතුරු නියමිත දිනට යැවිය යුතු බැවින් අදාල ගිහ බිල්පත් කඩිනමින් ගෙන්වා ගැනීමට අදාල ආයතනවලට ලිඛිතව දැනුම් දීමට කටයුතු කල යුතුය.

ගිණුම් කටයුතු පියවීම සම්බන්ධව යම් පැහැදිලි කර ගැනීමක් වෙතොත් බන්ධනාගාර කොමසාරිස් (මුදල්) හෝ නියෝජ්‍ය කොමසාරිස් (මුදල්) අමතන මෙන් කාරුණිකව දන්වමි. බන්ධනාගාර කර්මාන්ත අංශයේ ගිණුම් හා මුදල් පොත පියවීම සම්බන්ධව වෙනමම චක්‍රලේඛයක් නිකුත් කර ඇති බව වැඩි දුරටත් දන්වමි.

පී. ඩබ්ලිව්. කොඩිප්පිලි

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

පිටපත :-

01. ලේකම්, පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.

02. විගණකාධිපති

## 2012 වර්ෂයේ ගිණුම් පියවීම සඳහා බලය පැවරූ නිලධාරීන්ගේ නාම ලේඛණය

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

| අංකය | නිලධාරියාගේ නම | තනතුරු නාමය | ආයතනය |
|---|---|---|---|
| 01 | G.M.K. බණ්ඩාර | බන්ධනාගාර කොමසාරිස් (මුදල්) | බන්ධනාගාර මූලස්ථානය |
| 02 | J.A.G. ජයසිංහ | බන්ධනාගාර අධිකාරී | වැලිකඩ |
| 03 | E.M.J.C.B. ඒකනායක | බන්ධනාගාර අධිකාරී | කොළඹ රිමාන්ඩ් |
| 04 | P.S. බොතේජු | අධ්‍යක්ෂ - පුහුණු | ප.වි.පු.ම. |
| 05 | L.H.E. රංජන් | බන්ධනාගාර අධිකාරී | මැගසින් |
| 06 | P.R.W.M.A. ඒකනායක | සහකාර බන්ධනාගාර අධිකාරී | මහර |
| 07 | K.A.S. කොඩිතුවක්කු | බන්ධනාගාර අධිකාරී (වැ.ආ.) | මීගමුව |
| 08 | H.A.M.S.B. සේනානායක | සහකාර බන්ධනාගාර අධිකාරී | දුම්බර / දළුපොත |
| 09 | J.A.T. ජයසිංහ | බන්ධනාගාර අධිකාරී | මහනුවර |
| 10 | A.M.W. බණ්ඩාර | බන්ධනාගාර අධිකාරී | පල්ලේකැලේ |
| 11 | H.A.C. පෙරේරා | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ.) | යාපනය |
| 12 | T.I. උඩුවර | සහකාර බන්ධනාගාර අධිකාරී | අනුරාධපුරය |
| 13 | D.M.S. දසනායක | සහකාර බන්ධනාගාර අධිකාරී | බදුල්ල |
| 14 | S.R. ජයවීර ද සිල්වා | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ.) | තල්දෙන |
| 15 | L.J.M.K. බණ්ඩාර | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ.) | මඩකලපුව |
| 16 | W.A.D.C. කරුණාසේකර | බන්ධනාගාර අධිකාරී (වැ.ආ.) | ගාල්ල |
| 17 | T.W.L. චන්ද්‍රසිරි | සහකාර බන්ධනාගාර අධිකාරී | මාතර |
| 18 | එස්.කේ. පල්ලෙතැන්න | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ.) | වීරවිල |
| 19 | එස්.කේ. පල්ලෙතැන්න | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ.) | තංගල්ල |
| 20 | G.M.P. ලියනගේ | සහකාර බන්ධනාගාර අධිකාරී | කෑගල්ල |
| 21 | H.M.W.N.N. බණ්ඩාර | සහකාර බන්ධනාගාර අධිකාරී | කළුතර |
| 22 | W.A.D.C. කරුණාසේකර | බන්ධනාගාර අධිකාරී (වැ.ආ.) | බූස්ස |
| 23 | G.K.L. ප්‍රේමතිලක | සහකාර බන්ධනාගාර අධිකාරී | කුරුවිට |
| 24 | V.H.P. රණවක | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | වටරැක |
| 25 | A.H.M. අලහකෝන් | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | වාරියපොළ |
| 26 | A.F. ලාහිර් | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ.) | පොළොන්නරුව |
| 27 | T.U.K. ප්‍රනාන්දු | සහකාර බන්ධනාගාර අධිකාරී | මොණරාගල |
| 28 | R.S. අලහකෝන් | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ.) | ත්‍රිකුණාමලය |

- යම් හෙයකින් ඉහත බලය පැවරූ නිලධාරියෙකු ස්ථාන මාරු නියෝගයක් මත බන්ධනාගාර ආයතනය මාරු වන්නේ නම් ස්ථාන මාරු නියෝගය අනුව කටයුතු කළ යුතුය.

# බැරකම් පිළිබඳ ප්‍රකාශය ( 2012.12.31 දිනට නොගෙවූ හිඟ බිල්පත් විස්තර)

බන්ධනාගාර ආයතනයේ නම :-

| ණය හිමියාගේ නම * (ගෙවීම හිමියාගේ නම) | වගකීම පිළිබඳ විස්තර (සේවාව හෝ භාණ්ඩ මිලදී ගැනීම විස්තර) | අදාල වර්ෂය හා මාසය ( අදාල භාණ්ඩය හෝ සේවාව ලබා ගත් මාසය) | වැය විෂය සංකේතය | මුදල (රු.) |
|---|---|---|---|---|
| 01. අමාත්‍යාංශ රජයේ දෙපාර්තමේන්තු | | | | |
| 1.............................................. | | | | |
| 2.............................................. | | | | |
| 02. රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල | | | | |
| 1.............................................. | | | | |
| 2.............................................. | | | | |
| 03. පෞද්ගලික අංශය | | | | |
| 1.............................................. | | | | |
| 2.............................................. | | | | |

**උපදෙස් :-**

01. 2012 වර්ෂය තුලදී භාණ්ඩ මිලදී ගැනීම් / සේවාවන් ලබා ගැනීම් කර ඇතත්, අදාල සැපයුම්කරුවන්ට, කොන්ත්‍රාත්කරුවන්ට, රජයේ හෝ පුද්ගලික ආයතන වෙත ගෙවිය යුතු බිල්පත් 2012.12.31 දිනට පෙරනිරවුල් කිරීමට නොහැකි වූයේ නම් එම සියළුම වියදම් 2012 වර්ෂයේ බැරකම් ලෙස ගිණුම් ගත කල යුතුය. 2012 වර්ෂය තුලදී අදාල භාණ්ඩ හෝ සේවාවන් ආයතනය වෙත ලැබී නොමැති, එහෙත් එකී භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා ලිඛිත එකඟතාවයන් හෝ ගිවිසුම් ප්‍රකාරව 2013 වර්ෂයේදී ගෙවීමට නියමිත වියදම්ද මෙයටතේ ඇතුලත් කළ යුතුය.

02. දුම්රිය ,තැපල්, දේශීය ආදායම් වැනි දෙපාර්තමේන්තු හා බන්ධනාගාර කර්මාන්ත අංශයට ගෙවිය යුතු හිඟ බිල්පත් විස්තර අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු යටතේ ඇතුලත් කල යුතුය.

03. පලාත් පාලන ආයතන, විදුලි බල මණ්ඩලය, ජල සම්පාදන මණ්ඩලය, සමූපාකාර, සතොස, රාජ්‍ය ඖෂධ සංස්ථාව ආදී ආයතනවලට ගෙවිය යුතු හිඟ බිල්පත් විස්තර රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල යටතේ ඇතුලත් කල යුතුය.

04. බන්ධනාගාර නිලධාරීන්ට ගෙවීමට ඇති හිඟ වැටුප්/අතිකාල/ගමන් වියදම් වැනි බැරකම් ඇතුලත් කිරීමේදී අදාල මාසය හා වැය විෂය අනුව සාරාංශ කර පෞද්ගලික අංශය යටතේ ඉදිරිපත් කල යුතුය. **(නිලධාරීන්ගේ නමින් ඉදිරිපත් නොකල යුතුය)**

05. 2012 වර්ෂයට පෙර වර්ෂවල බැරකම් ඇත්නම් එම බැරකම්ද ඇතුලත් කල යුතුය.

06. අදාල බිල්පත් හා විස්තර නොපමාව ගෙන්වා ගැනීමට ආයතන ප්‍රධානීන් කටයුතු කල යුතුය.

07. මු.රෙ. 115 යටතේ අනුමැතිය ලබා ගත් හා ලබා ගැනීමට නියමිත බැරකම්ද ඇතුලත් කල යුතුය.

08. අත්තිකාරම්, පොදු තැන්පත් ගිණුම්, සුභසාධක අරමුදල් යටතේ ඇති බැරකම් ඇතුලත් නොකල යුතුය.

09. බැරකම් විස්තරය සිංහල භාෂාවෙන් සකස් කර එකී පරිගණක පිටපතක් (soft copy) ලබා දිය යුතුය.